**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2021**
---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය | ආයතනය වෙනුවෙන් වෙනමම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | කාර්ය මණ්ඩල අවශ්‍යතාවය හඳුනාගෙන අභ්‍යන්තර විගණන සහකාර තනතුරක් ඇති කිරීම සඳහා ඉල්ලීම කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත . | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 අංක 05 දරන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 4 (උ) වගන්තිය | ආයතනයේ ඉගැන්වීම්, පුහුණු කිරීම් හෝ පර්යේෂණ කිරීමේ කාර්යය සඳහා පුස්තකාල හා රසායනාගාර පවත්වාගෙන යාම සිදු කළ යුතු වුවද, විගණිත දිනය වූ 2022 මාර්තු 09 වන දින වන විටත් සිසුන්ට පුස්තකාල හා රසායනාගාර පහසුකම් සපයා දී නොතිබුණි. | 2021 සැප්තැම්බර් 15 වන දින සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු පත්කර ගැනීමෙන් අනතුරුව පුස්තකාලය ස්ථාපනය කිරීමේ කටයුතු වඩාත් විධිමත්ව සිදුකරගෙන යනු ලබයි . ආයතනය තුළ රසායනාගාර ඇති කිරීම නිශ්කාරණ වියදමක් වන බැවින් රසායනාගාර පිහිටුවීම සඳහා කටයුතු කර නොමැත. | පුස්තකාලය උපයෝජනය සඳහා අවශ්‍ය පහසුකම් සැලැස්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන හා 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | ආයතනය ස්ථාපිත කළ 2019 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2022 මාර්තු 20 දින වන විටත් ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 මාර්තු මාසයේදී ලංසු කැඳවා ඇති බැවින් ඉදිරියේදී ඇඟිලි සලකුණු යන්ත්‍රය මිලදී ගැනීමට බලාපොරොත්තු වේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබානොගෙන ආයතනය විසින් රු.3,370,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | පූර්ව අනුමැතිය ඉල්ලා 2021 දෙසැම්බර් 21 දින අමාත්‍යාංශය වෙත ලිපියක්ද යොමු කර ඇති අතර එසේ පූර්ව අනුමැතිය සඳහා යොමු කිරීමෙන් පසු එම මුදල් 2021 දෙසැම්බර් 30 වන දින ස්ථාවර තැම්පතු ගිණුමෙහි ආයෝජනය කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,121,329 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,371,700 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.749,629 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පාඨමාලා ගාස්තු ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 දෙසැම්බර් 18 දිනැති අංක 2048/46 දරන ගැසට් පත්‍රය මඟින් ස්ථාපිත කර තිබුණු දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පළමු ශිෂ්‍ය කණ්ඩායම සඳහා සිසුන් 19 දෙනෙකු 2020 අගෝස්තු මාසයේදී බඳවාගෙන තිබුණු නමුත් විගණිත දිනය වූ 2022 මාර්තු 09 දින දක්වාම දෙවන ශිෂ්‍ය කණ්ඩායම බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි. | MD in Ayurveda & Board Certification පාඨමාලාව සඳහා පළමු කණ්ඩායම 2020 අගෝස්තු 07 ආරම්භ කළද දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හෝ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් එක් එක් විශේෂඥතාවය යටතේ තනතුරු වෙන් වෙන් වශයෙන් දක්වා ආයතනය වෙත එවා නොමැති වීම, විශේෂඥ වෛද්‍යවරුන් කොටසක් පුහුණු කටයුතුවලින් ඉවත්වීම යනාදී කරුණු හේතුවෙන් 2022 මාර්තු 09 දක්වා දෙවන කණ්ඩායම බඳවා ගැනීමට නොහැකි විය. | දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි හැදෑරීමට අපේක්ෂිත සිසුන්ට ඉඩ ප්‍රස්ථාවක්ලබා දීම සඳහා සිසුන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයුර්වේද, සිද්ධ, යුනානි යටතේ අධ්‍යයන මණ්ඩල 12 ක් පත්කර තිබුණු නමුත්, ආයුර්වේද අධ්‍යයන මණ්ඩල යටතේ පාඨමාලා 05 ක් ආරම්භ කර තිබුණද, සිද්ධ හා යුනානි අධ්‍යයන මණ්ඩල යටතේ පාඨමාලා ආරම්භ කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | සියළුම විශේෂඥ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රධාන අධ්‍යයන මණ්ඩල සඳහා පාඨමාලා අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහනයක් මිලදී ගැනීම වෙනුවෙන් 2019 වර්ෂයේදී රු.8,809,163 ක් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු නමුත් වාහන මිලදී ගැනීම අත්හිටුවීම නිසා එම මුදල සම්බන්ධයෙන් භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබානොගෙන සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අරමුදල් කළමනාකරණ ගිණුමක තැන්පත් කර තිබුණි. | නව මෝටර් රථ මිලදී ගැනීමට අදාලව පැවති චක්‍රලේඛ බාධා හේතුවෙන් එම නිර්දේශය ක්‍රියාත්මක නොවිය. 2021 අප්‍රේල් මසදී මේ සඳහා අනුමැතිය ඉල්ලා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය වෙත ලිපියක් යවා ඇත.<br>එහිදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශය එම රු. මිලියන 07ක අරමුදල වාහනය මිලදී ගැනීම වෙනුවට ආයතනයට අවශ්‍ය අනෙකුත් ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා භාවිත කරන ලෙස දැනුම් දී ඇත. | භාණ්ඩාගාර උපදෙස් මත කටයුතු කළ යුතුය. |

**3.3 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මේ වන විට ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පවතින බොරැල්ල දේශීය ආයුර්වේද රෝහලේ පස්වන මහලෙහි කටයුතු පවත්වාගෙන යනු ලබන නමුත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට එළඹීමකින් තොරව විදුලිය හා ජලය ඇතුළුව පරිශ්‍රය පරිහරණය කරමින් 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.1,710,000 ක ප්‍රතිපාදනයක් සිදු කර තිබුණි. එසේ නමුත් ආයතනය, කාර්යාල හා අධ්‍යයන කටයුතු සඳහා කාර්යාල පරිශ්‍රය විධිමත්ව ස්ථාපිත කරගෙන නොතිබුණි. | 2021.04.23 වන දින පැවති 17 වන කළමණාකරණ රැස්වීමේදී ඉඩමක් හා ගොඩනැගිල්ලක් හඳුනා ගැනීම දෙවන විකල්පය ලෙස හඳුනාගෙන ඇති අතර පළමු විකල්පය ලෙස හඳුනාගෙන ඇත්තේ කොළඹ විශ්වවිද්‍යාලයට අයත් ජාතික ආයුර්වේද රෝහල ඉදිරිපිට පිහිටා ඇති ඉඩමේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයට හා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පොදු එක් ගොඩනැගිල්ලක් ඉදිකිරීමයි.<br>ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2021 හි 2.3 මූලධන වියදම් යටතේ නව ගොඩනැගිලි ඉදිකිරීමට තාවකාලිකව අත්හිටුවීමට රජය විසින් ගෙන ඇති තීරණය දීර්ඝ කරන බව දක්වා ඇත.තවද එකී චක්‍රලේඛයේම නව ගොඩනැගිලි කුලියට ලබා ගැනීමට ඉල්ලුම් නොකළ යුතු බව දක්වා ඇත. | අදාළ පාර්ශයවයන් සමඟ සාකච්ඡා කර ආයතනික පරිශ්‍රය විධිමත් පරිදි ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තාව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 හා 2020 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2022 මාර්තු 09 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | වාර්ෂික වාර්තාව සඳහා අවශ්‍ය අනුමැතීන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා ගැනීමෙන් පසු පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම සඳහා 2022 අප්‍රේල් 08 දිනය ලබා දෙන ලදී .<br>මෙම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ආයතනය විසින් සිදු කළ යුතු සියලු කටයුතු 2021 සැප්තැම්බර් 23වන විට අවසන් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |